# සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පනි පීඑල්සී PQ 67

ලියාපදිංචි අංක 84, රජ වීදිය, මහනුවර වෙබ් අඩවිය www.centralfinance.lk දුරකථන අංකය: 0112300555

AL06-24/01

දිනය :
ලිපිනය :

හිතවත් මහත්මයාණෙනි/මහත්මියණි,

**…………….වන දින අනුමත කරන ලද, යොමු අංක …….. දරන මෝටර් වාහන ණය පහසුකම**

මෝටර් වාහන ණය පහසුකමක් ලබාගැනීම පිණිස ඔබ විසින් ඉදිරිපත් කරන ලද අයදුම් පත්‍රය සම්බන්ධයෙන් අප සමාගම විසින් ඔබට ස්තුතිය පළකරන අතර , ඒ අනුව, එම මෝටර් වාහන ණය පහසුකම මෙහි පහත සඳහන් නියමයන් සහ කොන්දේසි මත ඔබ වෙත පිරිනමන බව මෙයින් සතුටින් දැනුම් දෙනු ලැබේ.

| ණය මුදලේ වටිනාකම (රුපි.) | කාලසීමාව - මාසවලින් | ණය ආපසු ගෙවීම (රුපි.) | සක්‍රිය වාර්ෂික පොළී අනුපාතය | මුද්දර ගාස්තු (රුපි.) | වෙනත් ගාස්තු (රුපි.) |
|---|---|---|---|---|---|
| | | | | | |

**පොළිය ගෙවිය යුතු දිනය**

ණය මුදල මුදාහැරීමේ දිනයෙන් පසුව එළඹෙන මාසයේ දී ආරම්භ වීම.

**ප්‍රමාද වී ගෙවීම් කිරීමේ ගාස්තු**

ප්‍රමාද වී ගෙවීම් සිදුකරන ණය වාරික මත අයකරන ප්‍රමාද ගාස්තු සහ අයවිය යුතු වෙනත් ගාස්තු , හිඟ මුදල මත මසකට ….% බැගින් වන අනුපාතයකට ගණනය කරනු ලැබේ . ණය ගිවිසුම කඩකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සහ /හෝ අවස්ථාවෝචිත පරිදි අප සමාගමේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙන්, එපරිදි දරන සියළුම පිරිවැය සහ සියළුම වියදම්, අප සමාගම වෙත ගෙවා පියවා දැමීමට ඔබ විසින් නීත්‍යානුකූලව පොරොන්දුවට බැඳී එකඟ විය යුතු වේ.

**රක්ෂණය**

අප සමාගම විසින් අනුමත කර ඇති රක්ෂණ සමාගම්/රක්ෂණකරුවන් සමඟ අපගේ සෙන්ට්‍රල් ෆිනෑන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම හරහා රක්ෂණයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

**ඇපසුරැකුම**

උකස් පනතේ 85 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි, මෝටර් වාහනය (ලියාපදිංචි අංක …...: වැසි අංක ….: නිමාව…..: මාදිලිය …….) සම්බන්ධයෙන් වන ප්‍රාථමික උකස් බැඳුම්කරය. …...පුද්ගලික ඇපකරය සහ හානිපූරණය.

**ණය පහසුකම ආපසු ගෙවා පියවා දැමීම පැහැර හැරීම සහ අයකරගැනීම**

උකසට තබා ඇති එකී මෝටර් වාහනය සම්බන්ධයෙන් , අප සමාගම වෙත අනුමත ණය නියෝජිතායතනයක් වශයෙන් ප්‍රදානය කර ඇති උකස් දේපළ විකිණීමේ බලය ක්‍රියාත්මක කිරීමට අප සමාගම වෙත බලය පැවරී තිබේ . ණය වාරික ආපසු ගෙවා පියවා දැමීම ඔබ විසින් පැහැර හරිනු ලැබුවහොත් , අප සමාගම විසින් ඔබ වෙත උපදෙස් ලබාදෙන අවස්ථාවේ දී, මෝටර් වාහනය ඔබ විසින් අප සමාගම වෙත ආපසු භාරදිය යුතු වේ . අප සමාගම විසින් ඒ සඳහා ඔබ වෙත භාරදෙන දැන්වීමට පසුව, මෝටර් වාහනය ඔබ විසින් අප සමාගම වෙත ආපසු භාරදීම පැහැර හරිනු ලැබුවහොත්, එකී මෝටර් වාහනයේ සන්තකය ආපසු ලබාගැනීම පිණිස නිසි පරිදි බලය පවරා ඇති අප සමාගමේ ඒජන්තවරුන්ට හෝ නම්කළ තැනැත්තන්ට එරෙහිව යම් කවරම වූ ප්‍රතිරෝධය පෑමක් ඔබ විසින් නොකළ යුතු බවට ඔබ විසින් මෙයින එකඟවනු ලැබේ . ඉන්පසුව, මෝටර් වාහනය විකිණීමෙන් ලැබෙන මුදල , අප සමාගම වෙත ඔබගෙන් අයවිය යුතු මුදල් පියවා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවන්නේ නම්, හිඟ මුදල් ශේෂය අයකර ගැනීම පිණිස ඔබට සහ ඔබගේ ඇපකරුවන්ට එරෙහිව නඩු කටයුතු පැවරීමට අප සමාගමට අයිතිය තිබිය යුතුය.

**සන්නිවේදන ගාස්තු**

තැපැල් ගාස්තු සහ කුරියර් සේවය සඳහා දරන ගාස්තු ඇතුළුව සියලුම සන්නිවේදන වියදම් ඔබගේ ණය ගිවිසුමට එකතු කිරීම සහ හරකිරීම සිදුකරනු ලැබේ.

**දැන්වීම භාරදීම**

යැවීමට හෝ භාරදීමට තිබෙන යම් කවරම වූ දැන්වීමක් , ඒ දැන්වීම, ඔබ විසින් ලබාදෙන ලිපිනයේ යම් කවරම වූ වෙනසක් සිදු වී නොමැති බවට ඔබ විසින් අප සමාගම වෙත දන්වා ඇත්නම් මිස , ඔබ විසින් ලබාදෙන එම ලිපිනයට යවා ඇත්නම්, ඔබ වෙත භාර දී ඇති බවට සැලකිය යුතු වේ . සියළුම සිහිකැඳවීම් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට/ජංගම දුරකථනයට යොමු කරන අතර, එහි යම් වෙනසක් සිදුවුවහොත්, එම වෙනස අප සමාගම වෙත දැනුම් දීම ඔබගේ නීත්‍යානුකූල වගකීම වේ. නොඑසේනම්, එවැනි සියලු දැන්වීම් ඔබ වෙත යථා පරිදි භාර දී ඇති බවට සැලකිය යුතු වේ.

**රජයේ බදු/අයකිරීම්**

ණය මුදල් සම්බන්ධයෙන් රජයේ බදුවල කලින් කලට සිදුකරන යම් වැඩිකිරීමක් හෝ වෙනසක් ඔබගෙන් අයකර ගනු ලැබේ.

**අධිකරණ බලය**

මෙම ණය පහසුකම ලබාගැනීම හෝ භාරගැනීම යම් කවරම වූ ස්ථානයක දී සිදු වුව ද , ඒ සම්බන්ධයෙන් අවශ්‍ය වුවහොත් නඩු කටයුතු පැවරීම, කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 270 දරන ස්ථානයේ පිහිටි අප සමාගමේ නගර කාර්යාලයට අදාළ වන ප්‍රාදේශීය අධිකරණ බලය පැවරෙන නිසි අධිකරණයේ අධිකරණ බලය ඇතුළත හෝ මහනුවර, රජ වීදිය, අංක 84 දරන ස්ථානයේ පිහිටි අප සමාගමේ ලියාපදිංචි කාර්යාලයට අදාළ වන ප්‍රාදේශීය අධිකරණ බලය පැවරෙන නිසි අධිකරණයේ අධිකරණ බලය ඇතුළත සිදුවිය යුතු වේ.

**තොරතුරු හුවමාරු කරගැනීම**

යම් කවරම වූ රහස්‍ය තොරතුරු හැසිරවීමේ දී , අප සමාගම විසින් අපගේ සමාගමටම අයිති හිමිකාර තොරතුරු හැසිරවීමේ දී කටයුතු කරන ප්‍රමාණයටම කටයුතු කරන නමුත් , ඔබගේ පෞද්ගලික දත්ත ඇතුළුව යම් කවරම වූ තොරතුරු අනාවරණය කිරීමක්, රාජ්‍ය ණය තොරතුරු කාර්යාංශයට, නීතිය බලාත්මක කරන නියෝජිතායතනවලට, මූල්‍යමය විධිමත්කරන්නන්ට, විගණකවරුන්ට, නීති උපදේශකවරුන්ට, අපගේ ආශ්‍රිත සමාගම්වලට සහ පරිබාහිරව සේවා සලසන්නන්ට/ඔවුන්ගේ ඒජන්තවරුන්ට ලබාගැනීමට ඉඩප්‍රස්ථාව තිබිය හැකි අතර , තව ද, තොරතුරු එපරිදි අනාවරණය කිරීම සඳහා ඔබ විසින් ඔබගේ කැමැත්ත ලබාදිය යුතු වේ . එමෙන් ම, මෙම ණය පහසුකම ප්‍රදානය කිරීමට පෙර සහ (ප්‍රදානය කළේ නම්,) ඊට පසුව යන අවස්ථා දෙකේ දී ම, ඔබ සහ ඔබගේ ඇපකරුවන් පිළිබඳව රාජ්‍ය ණය තොරතුරු කාර්යාංශය විසින් සිදුකරන විමසීම් සමඟ අප සමාගම තවදුරටත් කටයුතු කරන අතර , එවැනි විමසුම් සඳහා ඔබ විසින් ඔබගේ එකඟතාව මෙයින් පළකළ යුතු වේ.

**සමාගමේ බලයලත් නිලධාරීන් පරීක්ෂා කිරීම පිණිස පැමිණීම සහ ඊට අදාළ වන ගාස්තු**

මෝටර් වාහනය/උපකරණය කලින් කලට පරීක්ෂා කිරීමේ අයිතිය සහ මෙම ණය ගිවිසුම නිසි පරිදි ඉටුකිරීම පැහැර හැරීම කරන විටක දී, එය පරීක්ෂා කිරීම පිණිස පැමිණීමේ අයිතිය අප සමාගම විසින් මෙයින් තවදුරටත් රඳවා තබාගනු ලැබේ. එපරිදි පැමිණ පරීක්ෂා කිරීම් අප සමාගමේ බලයලත් නිලධාරීන් /ඒජන්තවරුන් විසින් දහවල් කාලය තුළ දී සිදුකරනු ලැබිය හැකිය . එපරිදි පැමිණ පරීක්ෂා කිරීම් පිණිස දරන සියළුම වියදම් ඔබගේ ණය ගිවිසුමෙන් අයකරනු ලැබේ.

ඉහත දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට අනුව කටයුතු කිරීමට ඔබ එකඟ වන්නේ නම් , මෙම ණය පහසුකම භාරගන්නා බවට සහතික කරමින්, මෙම ලියවිල්ලට සහ එහි දෙවන පිටපතට ඔබගේ අත්සන තබා , මෙම ලියවිල්ලේ දෙවන පිටපත අප සමාගම වෙත යොමු කරන ලෙස ඔබගෙන් මෙයින් ඉල්ලා සිටිනු ලැබේ. අප සමාගම විසින් සපයන මෙම සේවාව ඔබ විසින් ලබාගැනීම සම්බන්ධයෙන් අප සමාගම විසින් ඔබට ස්තූතිය පිරිනමන අතර , අප සමාගම සමඟ අන්‍යෝන්‍ය වශයෙන් ශුභදායි වූ ව්‍යාපාරික සම්බන්ධතාවක් ඔබ විසින් පවත්වාගෙන යනු ඇතැයි අපි නිබඳවම අපේක්ෂා කර සිටිනු ලැබේ.

මීට ඔබගේ විශ්වාසී,

..................................

කළමනාකරු/ශාඛා විධායක

සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී

*සැ.යු.* - පැමිණිලි වාචිකව හෝ ලිඛිතව අදාළ ශාඛා කළමණාකරුට, අපගේ පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය වන 0112038080 වෙත හෝ tellus@cf.lk වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කළ හැක. වැඩි විස්තර සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවියේ පළ කර ඇති ප්‍රධාන කරුණු ලේඛනය බලන්න : www.cf.lk/key-facts-documents/

---

........../......./.......

කළමනාකරු

සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී

මහත්මයාණෙනි/මහත්මියණි,

**........... වන දින අනුමත කරන ලද, යොමු අංක ........... දරන මෝටර් වාහන ණය පහසුකම**

මම/අපි ඉහත මෝටර් වාහන ණය පහසුකමේ නියමයන්වලට එකඟ වන අතර ,එම නියමයන්වලට අනුව මෙම ණය ගිවිසුමටට ඇතුළත් වීමට අපේක්ෂා කරමි/කරමු. තව ද, මා/අප විසින් ඔබ සමාගම වෙත සපයා ඇති, හෝ ඔබ සමාගම සන්තකයේ පවත්නා මාගේ/අපගේ යම් කවරම වූ ලේඛන/තොරතුරු/විස්තර, ඔබගේ සමාගමේ මනාපය පරිදි, තුන්වන පාර්ශ්වයක සේවා පරිගණකයක සුරක්ෂිත කොට ගබඩා කර තැබීමට ද, මම/අපි මෙයින් ඔබ සමාගම වෙත අවලංගු කළ නොහැකි එකඟතාව ලබාදෙමි/දෙමු. මම/අපි ඔබගේ සමාගමට ස්තූතිය පළකරමි/පළකරමු.

ඔබගේ විශ්වාසී,

| | | |
|---|---|---|
| .......................... | .......................... | .......................... |
| අත්සන | අත්සන | අත්සන |
| ණයුදෙනුකරුගේ නම : | 1 වන ඇපකරුගේ නම : | 2 වන ඇපකරුගේ නම : |
| ජාතික හැඳුනුම්පත් අංකය: | ජාතික හැඳුනුම්පත් අංකය: | ජාතික හැඳුනුම්පත් අංකය: |

.............................................................................

පිරිනැමීමේ ලිපියේ මුල් පිටපත සහ ඊට අදාළ සිංහල පරිවර්තන පිටපත ලැබුණි.